# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1908/38 - 2015 අප්‍රේල් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල
පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත
(262 වන අධිකාරය වූ)
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ
සොරණාතොට ප්‍රාදේශීය සභාවේ
උප සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම

උප සභාපති, සභාපති ධුරයට පත්වීම හේතු කොට ගෙන සොරණාතොට ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ, තනතුර දැරූ උප සභාපති වන විජේරත්න ගමගේ නීල් ප්‍රේමතිලක අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා බාල්රාමන් වේදාසලම් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

සොරණාතොට ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, බාල්රාමන් වේදාසලම් මහතා සොරණාතොට ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම් භාර නිලධාරී,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 01 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

04 - 630

1A - G 21349 — 17 (2015/03)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ චාවකච්චේරිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

මියයාම හේතු කොට ගෙන චාවකච්චේරිය ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

විජයරත්තිනම් එඩ්වින් ඩානියල් නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ චාවකච්චේරිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත නාම යෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

චාවකච්චේරිය ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී පොන්නුතුරෙයි කුගනාතන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2011 ජූලි මස 23 වන දින චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගත් අවසාන සභිකයා ළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබා ගත් තංගරාසා ශ්‍රීවෙංකඩේස්වරන් මහතා ඒ පුරප්පාඩුව ඇති වූ චාවකච්චේරිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. කුගනාතන්,
තේරීම් භාර නිලධාරී,
චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු මස 31 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

04 - 631

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.